# ද මැසිනොද් විදුහල - කඳාන

## දෙවනවාර පරීක්ෂණය - 2019

## සිංහල

10ශ්‍රේණිය

කාලය - පැය 1 26.07.2019

Learning Resource Center
R
De Mazenod College
Kandana

## I කොටස

- අංක 01 සිට 03 තෙක් වාක්‍යයන්හි තද කළු අකුරින් මුද්‍රිත කොටසට වඩාත් සමීප අදහස ඇති වරණය තෝරන්න.

1) ගං වතුර තර්ජනයට මුහුණ දුන් ප්‍රදේශවාසීන් විශාල පිරිසකට උන්හිටිතැන් අහිමි විය
   1. දේපළ  2. වාසස්ථාන  3. නවාතැන්  4. වස්තුව

2) ඔහු කවෝක්ති අතැඹුලක් සේ දැන ගත්තේ යැයි බොහෝ දෙනා ප්‍රකාශ කළහ
   1. නිර්මාණ කළේ යැයි  2. තක්සේරුවේ යෙදුණේ යැයි
   3. මුළුමනින්ම දැනගත්තේ  4. අධ්‍යාපනයේ නිරත වී යැයි

3) සහෝදර සහෝදරියන් සමඟ අත්වැල් බැඳගෙන ජීවත් වූ කාලය කෙමෙන් ගෙවී ගියේය
   1. අතට අත දීගෙන  2. එකට එක් වී
   3. වැලක් ලෙස එකතු වී  4. අත වැලක් මෙන් බැඳගෙන

- පහත සඳහන් වාක්‍යයන්හි හිස්තැන් වලට වඩාත් සුදුසු පදය තෝරන්න

4) විශේෂාංග ලිපියක්එහි අන්තර්ගත කරුණු සම්බන්ධ සෑම............................. ම ආවරණය කරමින් සම්පාදනය කරන ලද්දක් විය යුතුය.
   1. මූලාශ්‍රයක්  2. සිද්ධියක්  3. පාර්ශවයක්  4. අවස්ථාවක්

5) ගොවිතැන සමඟ ............................. ම බැඳුණු අනෙක් මහාර්ඝ නිර්මාණය නම් වැවයි
   1. අනිවාර්යයෙන්  2. අත්‍යන්තයෙන් 3. අනන්‍යතාවයෙන්  4. අතිපූජනීයව

6) ............................. යන්නෙන් අදහස් කරන්නේ ජීවන තක්සලාවෙන් ලබන පරිණත බුද්ධියත්, ග්‍රන්ථ පරිශීලනයෙන් ලබන බහුශ්‍රැතභාවය නැතහොත් බහු පඨිතතාවත් ය.
   1.සතතාභ්‍යාසය 2. පරිකල්පනය 3. ව්‍යුත්පත්තිය  4. ප්‍රතිභාව

7) මෙ දිවයිනේ ස්වාධීන ............................. මුල් බිජුවට සිටුවන ලද්දේ
   1. සභ්‍යත්වයක 2. සංස්කෘතියක  3.ශිෂ්ටාචාරයක  4. සම්ප්‍රදායක

8) අතීත උරුමයත් සංස්කෘතියත් හඳුනා ගැනීමට පුරාවස්තු............................. කිරීම හැමගේම වගකීමකි.
   1. සංරක්ෂණය 2.සංවර්ධනය  3. ප්‍රතිසංස්කරණය  4. පරීක්ෂණය

9) "අර්ධ ස්වර" හෙවත් අන්තඃස්ථාක්ෂර අනුරූප ස්වර යෙදී ඇති නිවැරදි පිළිතුර තෝරන්න
   1. අ,ආ,උ,ඌ  2. ඉ,ඍ,ඏ,උ  3.උ,ආ,ඍ,ඉ  4. උ,ඍ,ඏ,ඉ

10) අකාරාදී පිළිවෙලට නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න
   1. කන්කසන්තුරය,තිසාවැව,පිට බද්දර,බලපිටිය
   2.ගිරවා,සැළලිහිණියා,හංසයා,පරවියා
   3.අත්තනගල්ල,කුරුණෑගල,වීරවිල,මහරගම
   4.ඇන්තූරියම්,ඉද්ද,රෝස,පිච්ච

- අංක 11 සිට 13 තෙක් හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න

11) ජනාධිපත්වරණය කල්දැම්මට විවිධ ............................. බලපෑහ
   1. හේතූන්  2. හේතුහු  3. හේතු  4. හේතුවක්

12) ගුත්තිල කාව්‍ය කර්තෘ ............................. වැත්තෑවේ හිමි කෝට්ටේ යුගයේ විසීය
   1.නොහොත්  2.හෝ  3.හෙවත්  4. හා

13) .................... විසින් නාලාගිරි ඇතු දමනය කරන ලද අවස්ථාව විවිධ .................... විස්තර කරන ලදහ

1.බුදුරදු,කතුවරු　　　2.බුදුරදුන්,කතුවරුන්

3. බුදුරදු, කතුවරුන්　　　4.බුදුරදුන්,කතුවරු

14) කෙටි ඇදපිල්ල,පාපිල්ල,ඇලපිල්ල,රකාරංශය යන පිලි පිළිවෙළින් නිවැරදිව යෙදී ඇති වචන පේළිය තෝරන්න.

1. කුමාරිය,කුලකය, කාමරය, ද්‍රව්‍ය　　　3.රුවනාර,පුවක්පත, කාමරය, ක්‍රමය

2.රැල්ල, රුවල, මාර්ගය, පත්‍ර　　　4.කැමරාව,සාරණ, සිරස, ධර්මය

- අංක 15 සහ 16 ප්‍රශ්න වල සෑම පදයම අක්ෂර වින්‍යාසය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න

15) 1. වත් පිළිවෙත්,කැළඹීම,පරිශීලනය,ප්‍රකාශණය

2.පෙළපාලි, ප්‍රශංසාව,ශ්‍රේෂ්ඨ, සැළකිල්ල

3.ආභාසය, නිෂ්පත්තිය, ප්‍රෞඪ, යථාර්ථවාදී

4.අභින්ෂ්ක්‍රමණය, අනභිබවනීය,ප්‍රතිඵලය, සාක්ෂාත්

16) 1. නිර්මාණය, ඓතිහාසික, කුනගාටුව, උච්චාරණය

2.කෞතුක,තාක්ෂණය,ගවේශනය, නිෂ්පල

3. සාකච්ඡාව, ආභාෂය, පුස්ථකාලය, ජන්දය

4.ලාංචනය, නිර්භය, ලේඛනය, විශිෂ්ඨ

17) "නටනු ලැබූහ" යන අතීතකාල කර්මකාරක බහු වචන අඛ්‍යාතයෙහි, වර්තමාන කාල කර්තෘ කාරක බහුවචන ආඛ්‍යාතය වන්නේ,

1. නටයි　　2.. නැටූහ　　3. නටනු ලබති　　4. නටති

18) ඉරිඇඳි පදවල ක්‍රියා වර්ගය පිළිවෙලින් නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න

- නහින දෙහින කාලෙම පින් කෙරුව <u>යුතු</u>
- මීතුරු කමින් පෙරට <u>එකොත්</u>
- බෙරදවුල් හඬ <u>අසා</u> ඇහෙහි මස වියරු වෙයි
- කළු වලා <u>කැලඹෙමින්</u>මුදුන් වී නැගෙනවා

1. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා

2. විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

3. විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

4.අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා,මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා

19) මුලින් දී ඇති වර්ගයට අයත් නොවන පදයක් සහිත වර්ණය තෝරන්න

1. නිපාත පද - වහා,හෙට,මෙන්,අනේ

2. තද්ධිත පද - රිදීමය,සිල්වත්,දක්ෂතා,ජනතා

3.ක්‍රියා පද - නටවයි,දුවමින්,ලියා,බලන

4.යුගල පද - ඇතිනැති,එහාමෙහා, කරදර, උඩයට

20) තද කළු අකුරින් මුද්‍රිත පදයට සමානාර්ථවත් පදය තෝරන්න

"එකල්හි අනඳ මහතෙරහු බුදුන් කෙරේ බලවත් සෙනෙහයෙන්<u>අධිවාසනා</u> නොකටැහී"

1. අධික වාසනාව　　2. සෙත්පැතීම　3. ඉවසීමේ ගුණය　　4. සෑද්ධි බලය

21) පහත ප්‍රකාශයට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න

"අයමාර්ග මුළුමනින්ම විනාශ කර දැමීම"

1. අටුව කඩා පුටුව සෑදුවා වගේ

2. අතු කඩා මොර කන්නා සේ

3. පුංචි අම්මාත් ඇවිත් කැවුම් පුංචි කළා වගේ

4. කැලේට පායපු හඳ වගේ

22) අර්ථයෙන් විරුද්ධ පද දෙකක් එකතු වී සෑදෙන යුගල පද ඇතුලත් නොවන පේළිය තෝරන්න

1.ඉඩම් කඩම්, අග හිඟ, ඉඳුම් හිටුම්, ලේසි පහසු

2. උස් මිටි, ඇත්ත නැත්ත, යාම් ඊම්, ඔබ මොබ

3.ලාභ අලාභ, ගොඩ මඩ, හොඳ නරක, ඇත මෑත

4. අය වැය, සිරිත් විරිත්, උඩබිම, පින්පව්

පාද කළු අකුරින් ඇති පාඨයේ අදහස වඩාත් නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න

3) "සබවස කුලුණු මෙත් මුදිතා දහම් සැම"

1. යහපත් සිරිත් මිස දුසිරිතින් තොර බවයි
2. සත්‍යය, මෛත්‍රිය යන ධර්මයන්ගෙන් යුක්ත බවයි
3. සත්‍ය වචනය, කරුණාව, මෛත්‍රිය හා මැදහත් බව යන ධර්මයන්ගෙන් යුක්ත බව
4. සත්‍ය,කරුණාව,මෛත්‍රිය හා මැදහත් බව යන ධර්මයන්ගෙන් යුක්ත බව

4) "එතෙපුල්අමා හැල්ලෙන් කෝ ගිනිකඳ නිවී ගිය"

1. ඒ වචනයෙන් කෝපය නිවී ගියේය
2. ඒ වචනය නමැති අමෘත ධාරාවෙන් කෝපය නමැති ගිනි ජාලාව නිවී ගියේය
3. ඒ වචනය නමැති අමෘතයෙන් කෝපය නිවී ගියේය
4. ඒ වචනයෙන් කෝ ගින්න නිවී ගියේද?

5) "බඩ වක පිට වක සන් වැරටිල්ලා"

1. බඩ ඇද වීමත් පිට ඇද වීමත් නිසා වියළි ගොම කැබලි සේ දිස්වේ.
2. බඩත් ඇද පිටෙහි ඇද මදිවාට වියළි ගොම කැබලි ගැවී ඇත.
3. බඩ වක් වී පිටද වක් වී වියළි ගොම කැබලි මෙන් දිදුලයි.
4. බඩෙහිඇදයයි පිටෙහි ඇදයයි නිසා වියළුණු ගොම කැබලි විසිවේ.

6) පහ දී ඇති පද යුගලවල අර්ථය වරදවා දී ඇති පදයක් සහිත වර්ණය තෝරන්න.

1. යොඩු - කම්මුල්         , නරමුල්-පැසුණු කෙස්
2. කග- අසිපත , බරණින්- ආභරණවලින්
3. රිදී වනින් -රිදී පාටින් , සබවස- සත්‍ය වචන
4. මාගමක්- ළඳරුවෙක්, කෝවේයකට - කුඩා විදියකට

7) නිවැරදි විරාම ලකුණු යෙදී ඇති පිළිතුර තෝරන්න.

1. "ළමයෝඉක්මනට ගෙදර දුවපන්. අපි අද රෑ මෙහි නතර වෙනවා," යි කීහ.
2. "රත්තරන් හැංගිලා. ගල් බොරළු මතුවෙලා... අපට ඔවයින් වැඩක් නැහැ" ඇ පිළිතුරු දුන්නාය.
3. "මෙ ඇත් පළමු මා රාව" යි බුදුන් සඳහා දිවි පියා බුදුන් පෙරට සිටියො."
4. "හොඳ අපූරු දවසක්" යමු බිලිබාන්න බිම් පණුවා.

) පහත දී ඇති ප්‍රකාශ ඇතුලත් පාඩම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

"මං තවත් නම් පෙත්සම් ලියන්නෙ නැහැ,"
"සමහර දාට මම රට කාලා මිදුලට ගිහිල්ලා උඩ බලාගෙන ඉන්නවා"
"එහෙත් අපට එකම විද්‍යාලයක්වත් ඇතැයි අවංකව ප්‍රකාශ කළ හැකි ද?"
"ළමයෝ ඉක්මනට ගෙදර දුවපන්. අපි අද රෑ මෙහි නතර වෙනවා" යි කීහ.

1. තොරෝක්කෝව, පුවත්පත් විශේෂාංග ලිපි, කාව්‍ය නිර්මාණකරණය, ආචාර්යටී.බී. ජායා
2. ආචාර්ය ටී.බී. ජායා, තොරෝක්කෝව, පුවත්පත් විශේෂාංග ලිපි, කාව්‍ය නිර්මාණකරණය
3. පුවත්පත් විශේෂාංග ලිපි, කාව්‍ය නිර්මාණකරණය, ආචාර්ය ටී.බී. ජායා , තොරෝක්කෝව
4. පුවත්පත් විශේෂාංග ලිපි, කාව්‍ය නිර්මාණකරණය, තොරෝක්කෝව , ආචාර්ය ටී.බී. ජායා

සාමාජික, කැබිලිති, නාරටි, වරලස්, යන තද්ධිත පදවල ප්‍රත්‍ය වෙන්කළ විට නිවැරදි පේළිය තෝරන්න.

1. ඉක, ඉටි, අටි, අස්     2. ජික, ලිති, රටි, ලස්     3) ඉක, ඉති, රටි, අස     4) ඉක, ඉති, ඉටි, ඇස

පහත ප්‍රකාශ වලින් වැරදි පිළිතුර තෝරන්න.

1. ගෞරවාර්ථ ප්‍රත්‍යන්හි යෙදෙනුයේ මූර්ධජ 'ණ' යන්නයි.
2. දන්තජ ව්‍යඤ්ජනාක්ෂරයකට පෙර හල්ව යෙදෙනුයේ 'න' කාරයයි.
3. සංස්කෘත වචන වල තාලුජ 'ශ' කාරයට පරව යෙදෙන්නේ 'න' කාරයයි.
4. ඍ, ර්, ෂ් යන මූර්ධජ අකුරු වලට පර ව යෙදෙන්නේ දන්තජ 'න' කාරයයි.

අංක 31-32 තෙක් ප්‍රශ්න වලදී ඇති එක් එක් ප්‍රකාශනයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

අයහපත් ගුණාංග මැනවින් ප්‍රදර්ශනය වීම.

1. උපන් ගෙයි සිරිත බලි ඇරියත් නැරේ.
2. ඉබ්බා දියට දැම්මා වගේ.
3. උණ හපුළුවගේ පැටියා ළඟට මැණිකක් ලූ
4. කිරි මුහුදට හඳ පැව්වා වගේ

32) අගයක් නොමැති වීම,

1. උඩින් මිතුරු යටින් හතුරු
2. කැලේට පැයු හඳ වගේ
3. කොහොඹ ගහට කරවිල වැල ගියා වගේ
4. ආතට අටුකොස් දුන්න වගේ

33) නාට්‍යයක මුහුණේ ඉරියව් මඟින් අදහස් ප්‍රකාශනය,

1. ආංගික අභිනය 2. වාචික අභිනය 3. ආහාර්ය අභිනය 4. සාත්වික අභිනය

34) 'වත රතුපුල් - නෙත නිලුපුල්' මෙහි ඇති අලංකාරය නම්,

1. උපමා අලංකාරයකි. 2.රූපක අලංකාරයකි.
3.උත්ප්‍රාසාලංකාරයකි 4. අර්ථාලංකාරයකි.

- අංක 35-38 තෙක් ප්‍රශ්න වල නිවැරදි ව්‍යාකරණානුකූල වාක්‍ය තෝරන්න.

35)

1. ඔහු දක්ෂ වෛද්‍ය වරයෙකු වෙයි.
2. බුද්ධදාස රජතුමා ශෛල්‍ය වෛද්‍ය වරයෙක් විය.
3. දෙගුරුන් පුදන දරුවන් ගුණවත් දරුවෝ වෙති.
4. අද දරුවෝ හෙට දිනන නායකයන් වූ.

36) .

1. තෙරුන් වහන්සේ සුමධුර කවි බණක් දෙසුවේය.
2. විභීෂණ දෙවියෝ කැලණි විහාරයේ අරක්ගෙන සිටිති.
3. සෝරත නාහිමි ශාස්ත්‍රීය ග්‍රන්ථ රසක් සම්පාදනය කලහ.
4. සිටාණෝ තම ධනය දුගී මගී යාචකාදීන් හට නොමසුරුව බෙදා දුන්නේය.

37) .

1. තම පිලිට විශිෂ්ට සේවයක් කළ ඔහු දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයෙක් විය.
2. පාසලෙන් ලද කැඳවීමක් අනුව පියදාස පියා කැටුව පාසලට ගියහ.
3. ලසිත් මාලිංග වේගවත් හයේ පහරක් එල්ල කරනු ලැබිය.
4. ගෙහිමි කත විසින් ආගන්තුකයාට බැන වැදුනාය.

38) .

1. මිනිස්සු යහපත උදාකර නොගන්නේ ඇයි?
2. ශිෂ්‍යයෝ දස දෙනෙක් සතියකින් ගුවන් යානය සකස්කොට නිම කළහ.
3. පයින් යන්තෝ පාරේ දකුණු පසින් යාම මැනවි.
4. සියලු දරුවන් අවංක විය යුත්තෝය.

- අංක 39-40 ප්‍රශ්න වලට දක්වා ඇති කොටසේ එක් එක් අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වර්ණය තෝරන්න.

39) "මේ පොළවේ ගිනි නිවිච්චේ තුඹගේ අම්මා නිසාය"

1. අම්මා ගිනි නිවීමෙහි නිරත වී සිටින බවයි.
2. අම්මා ගිනි නිවන හමුදාවේ සේවය කරන බවයි.
3. ජාතියේ සියලු දරුවන්ගේ දුක් ගිනි නිවන්නී අම්මාය.
4. අම්මා ගංගාවක් බඳුය.

40) "එකල්හි බුදුහු ඉදුහ බලයෙන් ආනන්ද හිමියන් පිළිබඹා සඟුන් අතුරෙහි සිටුවුහ.

1. බුදුන් ආනන්ද හිමියන්ව සෘද්ධි බලයෙන් වැළැක් වූහ.
2. බුදුහු ආනන්ද හිමියන්ව සෘද්ධි බලයෙන් වලකා භික්ෂූන් සමඟ සිටීමට සැලසූහ.
3. තම සෘද්ධියෙන් ජ්‍යෙෂ්ඨ භික්ෂූන් ලඟ සිටීමට බුදුහු කටයුතු කළහ.
4. ආනන්ද හිමි අනෙක් භික්ෂූන් සමඟ බුදුන් ඉදිරියේ සෘද්ධි ප්‍රාතිහාර්ය පෑවේය.

26 . 07 . 2019

ද මැසිනොද් විදුහල - කඳාන

දෙවන වාර පරීක්ෂණය - 2019

# සිංහල භාෂාව හා සාහිත්‍යය - II

10 ශ්‍රේණිය

කාලය : පැය 2 යි

01. (i) සිට (x) තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න.

කිසියම් අනුකොටසකට උත්තර නොලියන්නේ නම් එම ප්‍රශ්න අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i). සිංහල අක්ෂර මාලාවේ ඇතුළත්,

(අ). ' වර්ගාන්ත' අක්ෂර දෙකක් ලියන්න.

(ආ). ' අර්ධස්වර' දෙකක් ලියන්න.

(ii). පහත තත්සම වචන සඳහා සුදුසු තද්භව වචන ලියන්න.

(අ). අමෘත ධාරාව (ආ). ඉඳුහ බලය

(iii). පහත වචනවල තේරුම ලියන්න.

(අ). වැරවිල්ලා (ආ). දහසක් කිරියහැල් කෙතින්

(iv). පහත සඳහන් කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරක යට ද කර්ම කාරක වාක්‍ය කර්තෘ කාරකයට ද හරවා ලියන්න.

(අ). කුඹල් කරුවෝ සකපෝරු වලින් මැටි භාණ්ඩ සාදති.

(ආ). කම්කරුවන් තිදෙනෙකු විසින් තොරොක්කෝව තල්ලු කරන ලදි.

(v). පහත සඳහන් වාක්‍යයේ අනුක්ත පදයක් සහ නිපාත පදයක් තෝරා ලියන්න.

" පිත්පිඩ වැනි මා මැණිය කියනු නොවලහා"

(අ). අනුක්ත: (ආ). නිපාත:

(vi). පහත සඳහන් වාක්‍ය සදොස් නම් නිදොස් කර ලියන්න.

(අ). අයහපත් කාලගුණය නිසා ගොවියෝ හේන් අත්හරිනු ඇත.

(ආ). ' ත්‍රස්තවාදියෝ යළි බෝම්බ පුපුරවනු ඇතැ' යි අප සිතුවෙමු.

(vii). අක්ෂර වින්‍යාස වැරදි සහිත වචන හතර පමණක් උපුටා ලියන්න.

" මැතිවරන සමය තුළ සියළු අධ්‍යාපන කොට්යාෂ වලට අයත් රජයේ පාසල් වල සමීක්ශණ කණ්ඩායම් රඳවා තැබීම ට රජය පියවර ගෙන ඇත."

(viii). (අ). " නරමුල් ඇඟ ඇට කිබුලකු වැන්නේ"

ඉහත කවි පාදයේ,උපමානය උපමේය වෙන වෙනම ලියන්න.

Learning Resource Centre
R
De Mazenod College
Kandana

(ආ). " ස්වාමිදරුවන් ගේ මධුර නාද නමැති හස්ති කාන්ත වීණා නාදය"

ඉහත ප්‍රකාශයේ සඳහන් කාව්‍යෝපක්‍රමය කුමක්ද ?

(ix). පහත සඳහන් පද සඳහා පොදු ව්‍යවහාර ලියන්න.

(අ). කුම්භකාර (ආ). අක්වැස්ස

(x). පහත සඳහන් යෙදුම් සඳහා තනි පද ලියන්න.

(අ). ලාලිත්‍ය බවින් යුතු.

(ආ). කාව්‍ය නිර්මාණකරණය හා විවිධ ශාස්ත්‍ර හා විෂය සම්බන්ධ පරිණත අවබෝධය

02. පහත දැක්වෙන අ , ආ , ඉ , ඊ යන විස්කර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් යොදන්න.

(අ). වෙර වීරිය ඇතත් හිතේ
පියකරු බව ඇතත් වතේ
දහදිය නොම සැලෙන ගතේ
ඔබ පොළොවට බරකි පුතේ

වැනි ගීත තුළින් අපගේ මාතෘ භූමිය පිළිබඳ ඇල්මක් ඇති කරවීමට උත්සහ දරයි. එම ගීත ඇසෙන විට අපගේ හදවත දේශානුරාගයෙන් දේශවාත්සල්‍යයෙන් පිරී යයි. එවැනි ගීත මඟින් රට වෙනුවෙන් අපගේ යුතුකම් වගකීම් මතක් කර දෙන අතර රටට ආදරය කරන මිනිසුන් බවට පත්වීමට අවශ්‍ය ශක්තිය ලබා දෙයි. තවද අපේ රටේ උතුම් බව වර්ණනා කළෝ ශ්‍රී ලාංකිකයෝ පමණක් නොවෙති. ශ්‍රී ලංකාව දැකීමෙන් පමණක් නොව ඒ ගැන ඇසූ පමණින් ද අප රට ගැන මහත් වාත්සල්‍යයකින් ගද්‍ය පද්‍ය රචනා කළෝ රැසක් වෙති. එසේනම් මහත් අභිමානයකින් යුතුව මේ මව්බිම අනාගත දැයට රැක දීම අපගේ පරම යුතුකමකි.

(ආ). සිරිත් විරිත් ඇදහිලි විශ්වාස යනු රටක සංස්කෘතිය පිළිබිඹු කෙරෙන එක් පැතිකඩකි. මිනිසුන්ගේ ජීවනෝපාය මාර්ග මුල් කර ගනිමින් ද විවිධ සිරිත් විරිත් ඇදහිලි ආදිය නිර්මාණය වී ඇත. වී ගොවිතැන, හේන් ගොවිතැන, මැටි කර්මාන්තය ආදී දේශීය කර්මාන්ත පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් එකී සංස්කෘතිකාංග පිළිබඳ දැනගැනීමට හැකිවෙයි. එම වෘත්තීන් හි පැවති ස්වාධීනත්වය හා පරිසර හිතකාමී බව ආදී කරුණු වලින් ජාතිකාභිමානයක් ඇතිවනවා පමණක් නොව අතීත ගැමියෝ සහජීවනය සහයත්වය තුළ එම කර්මාන්ත කරගෙන ගිය ආකාර පිළිබඳ අවබෝධයක් ද ලබා ගත හැකිය. සිංහල සංස්කෘතිය වඩාත් ඉස්මතු වී පෙනෙන්නේ මෙම පැරණි වෘත්තීන් ඔස්සේය. මෙම පැරණි කර්මාන්ත අමතක කොට විදේශ රට වලට ආ වැඩීමෙන් අප මුල් සිඳුණු ජාතියක් බවට පත් වී ඇති බවක් නොහැඟෙන්නේ ද ?

(ඇ). මිනිස් ගුණධර්ම පිරිහී යාම වර්තමාන සමාජයේ දැකිය හැකි ප්‍රබල ගැටළුවකි. ඊට සංකීර්ණ සමාජ රටාව මෙන්ම නූතන ජන මාධ්‍ය භාවිතය ද වගකිව යුතු බව පවතින මතයකි. මාධ්‍ය සදාචාරය පිරිහීම හා සාරධර්ම අරමුණු කරගත් මාධ්‍ය භාවිතයක් නොමැති කම සමාජයට දැඩිව බලපායි. සාරධර්ම සපිරි යහපත් මාධ්‍ය භාවිතයෙන් යුතු සමාජයක් කාලීන අවශ්‍යතාවයකි.

(ඈ). සාහිත්‍ය පොතපත කියවීම තුළින් දැනුමත් සාහිත්‍ය පිළිබඳ රුචියත් වර්ධනය වේ. පාසල් දරුවන් කියවීමෙන් ඈත් වුවහොත් අනාගතයේ අපට අහිමි වන්නේ දැනුවත් පරම්පරාවක් පමණක් නොව සදාචාරවත් සමාජයක්ද විය හැකිය. සාහිත්‍ය පොතපත කියවීමේදී පැරණි නූතන ගද්‍ය පද්‍ය පමණක්

නොව දෙස් විදෙස් උසස් සාහිත්‍ය කෘති තෝරාගෙන කියවීමට සැමවිට උත්සහ කළ යුතුය. පාසල් සිසුන් සාහිත්‍ය පොතපත කියවීමට නැඹුරු කරවීම සැම වැඩිහිටියෙකුගේ ම යුතුකමක් හා වගකීමක් ද වෙයි.

03. පහත දැක්වෙන ඡේදය වචන 50 - 55 අතර ගණනකින් යුක්ත වනසේ සාරාංශ කොට ලියන්න.

බ්‍රිතාන්‍ය යුගයේ දී අපේ ගම්වල පරිපාලනය භාරව කටයුතු කිරීම සඳහා වරප්‍රසාද ලත් ප්‍රභූන් පිරිසක් නිර්මාණය වී සිටියහ. රජයේ නිලධාරීන්ගෙන් සමන්විත වූ මෙම පන්තිය මුහන්දිරම්, වෙල් විදානේ, විදානආරච්චි, පොලිස් විදානේ, ගම්මුලාදෑනියා, පොලිස් නිලධාරීන් ලෙස විවිධ තනතුරු භාරව කටයුතු කළ බව එකල සමාජය පිළිබඳ කරන අධ්‍යයන වලින් පැහැදිලි වේ. මෙම පුද්ගලයන් ගම්වල සමාජ ආර්ථික කටයුතු සමගාමීව කළ බව ද පෙනේ. එම නිලධාරීන් පාලන කටයුතු ගෙනගිය ආකාරයත් එකල පැවති සමාජ ව්‍යුහයේ සංවිධානාත්මක ස්වරූපයත් ගැන බොහෝ කරුණු රාජ්‍ය ලේඛනාගාරයේ තැන්පත් විවිධ දිස්ත්‍රික්කවලට අයත් කච්චේරි ලේඛනවල ඇතුළත් තොරතුරුවලින් අනාවරණය වේ. මෙම තනතුරු ධූරාවලින් මඟින් විශදවන කරුණු පිළිබඳව මෙතෙක් ලියැවී ඇති ප්‍රමාණය ඉතා සීමාසහිතය. එයිනුදු ප්‍රාථමික මූලාශ්‍ර ඇසුරු කොට ඇත්තේ ඉතා සීමාසහිත පිරිසකි. අවම පර්යේෂකයින් ටවක් ස්පර්ශ කළ දත්තයන් පසෙක තබා කච්චේරි ලේඛන බොහෝ ප්‍රමාණයක් ඇසුරු කොට මේ පිළිබඳ කරුණු රැසක් අනාවරණය කිරීමට හැකිවේ.

04. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

මිනිස් කටයුතු බොහෝමයක ම අරමුණ ප්‍රගතියයි. ඉදිරිපත් වන වැඩවල බැරෑරුම්කම හා සංකීර්ණ භාවය අනුව ඒවා තනිවම කළ නොහැකි බව පැහැදිලි වන අවස්ථා වලදී සාමූහිකව කටයුතු කිරීම ආදි මිනිසා අනුගමනය කළ ක්‍රියා මාර්ගයක් විය. එක් කෙනෙකුට විශාල කඳක් පලංචියකට නැංවීම කළ නොහැකිය. එහෙත් කීප දෙනෙකු එකතු වී සාමූහිකව ක්‍රියා කිරීමෙන් එය පහසුවෙන්ම කළ හැකි වන්නේය. සරල ක්‍රම උපයෝගී කරගෙන කෘෂිකර්මයෙහි යෙදුණු ආදි කාලීනයන් අන්‍යෝන්‍ය සම්බන්ධතාවෙන් යුතුව කටයුතු කරමින් සරු ඵල නෙලා ගත් බව ඉතිහාසය පුරාම සටහන් වී ඇත. නූතන යුගයේ කෘෂිකර්මය හා කර්මාන්ත වර්ධනය වීමත් සමඟ ම ඒ හා බැඳුණු කුඩා මහත් කටයුතු ද ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ගියේය. අදාළ දක්ෂතා සමාන්තරව ම වර්ධනය විය යුතු නිසා ඒ අංශ සඳහා ද නිපුණත්වයක් ලැබීම අවශ්‍ය විය. මේ බෙදී යෑම අද කොතරම් දුරට වර්ධනය වී ඇත්දැයි කියතොත් යන්ත්‍රයක ඇණයක් තද කිරීම පවා ඒ සඳහා ම විශේෂ පුහුණුවක් ලද්දෙකුගේ කටයුත්තක් ටට පත් වී තිබේ. සංකීර්ණ වූ සමස්ත කාර්ය පද්ධතිය ම එක් කෙනෙකු විසින්ම නිම කිරීමට යෑම හෙවත් දොඩම් ගොඩම තනි අතින් බදා ගැනීම වෙනුවට ශ්‍රම විභජනය හා රැකී රක්ෂා බෙදී යෑම ඇති වූයේ මේ ආකාරයටය.

(i). සාමූහිකව කටයුතු කිරීමට ආදි කාලීනයන් පෙළඹුණේ ඇයි?

(ii). " සුවිශේෂ පුහුණුවක් ලද්දෙකු ම ඒ ඒ කාර්යයෙහි යෙදවීම නූතන ප්‍රවණතාවයයි" යන අදහස හෙළි කරන වැකිය උපුටා දක්වන්න.

(iii). මේ පාඨයේ මුඛ්‍ය අදහස කුමක් ද?

(iv). " දොඩම් ගොඩම තනි අතින් බදා ගැනීම" යන යෙදුමෙන් මෙහි අවධාරණය කරන්නේ කුමක් ද ?

(v). පහත සඳහන් වචන වල විරුද්ධ පද ලියන්න.

ප්‍රගතිය සංකීර්ණ

05.

- ලංකා සේසත් මෙරට ඉතා පිටිසර ගමක් වූ වේරහැර මැටිකුඹුරේ පාසලක උගත් දිළිඳු දරුවෙකි.
- ගමට විදුලිය තිබුණත් ලංකාගේ නිවසට විදුලිය නොතිබුණෙන් ඔහු පාඩම් කළේ නිවස අසලම තිබූ ලයිට් කණුවෙන් යාන්තම් නිවසට පතිත ආලෝකයෙනි.
- ඉතා අසීරුවෙන් පාඩම් වැඩ කළ ලංකා සිය පුංචි ගමේ පාසලෙන් ම විශ්ව විද්‍යාල වරම් ලබා මහත් අභිමානයෙන් මොරටුව විශ්ව විද්‍යාලයෙන් ප්‍රථම උපාධිය සමත් විය. කුඩා කලම පියා අහිමි වූ ලංකාගේ එකම රැකවරණය වූයේ සිය මව පමණි.
- ඔහු තුළ තිබූ දස්කම් මෙන්ම කැපවීම නිසා ඔහුට පශ්චාත් උපාධිය සඳහා විදේශ ශිෂ්‍යත්ව වරම් ලැබුණි.
- ඒ අනුව විදෙස් ගත වූ ලංකා සියලු උසස් විභාග ඉහළින්ම සමත් වූ අතර වර්තමානයේ නාසා ආයතනයේ ඉහළම තනතුරකට පත් වී සිටී. ආසියාතිකයෙක් ප්‍රථම වරට ලබා ගත් එවැනි තනතුරක් ලංකා සේසත් වැන්නෙකුට හිමි වීම සුවිශේෂ කරුණකි.
- ඔහුගේ හැකියාව, කැපවීම, නොපසුබට උත්සාහය නිසා අද ආලෝකමත් වී ඇත්තේ ඔහුගේ නිවස, කුඩා ගම්මානය පමණක් නොව, මුළු ලංකාවමයි. මුළු ලෝකයම අද ඔහු හඳුනති. ඔහුගේ දස්කම් ගැන කතා කරති.

මෙම කරුණු මුල් කරගෙන පුවත් පත් විශේෂාංග ලිපියක් ලියන්න. ඔබේ පිළිතුරේ වචන 125 ක් පමණ තිබීම ප්‍රමාණවත්ය.

නැතහොත්

මහබෝලාන, දිදුල සුබ සාධක සංගමයේ ලේකම් ඔබ යැයි සිතා, ගම්වැසියන්ගේ ගමනාගමන දුෂ්කරතාවය විසඳීමේ අරමුණින් එම සංගමය මගින් සංවිධානය කරනු ලබන මහා ශ්‍රමදාන ව්‍යාපාරයට ස්වේච්ඡාවෙන් සහභාගි වන ලෙස දැනුම් දෙමින් ගම් වැසියන් වෙත ප්‍රදර්ශණය කිරීම සඳහා දැන්වීමක් සකස් කරන්න.

# ද මැසිනොද් විදුහල - කඳාන

## දෙවනවාර පරීක්ෂණය - 2019

## සිංහල

10ශ්‍රේණිය . ......... කාලය - පැය 1 26.07.2019

### I කොටස

- අංක 01 සිට 03 තෙක් වාක්‍යයන්හි තද කළ අකුරින් මුද්‍රිත කොටසට වඩාත් සමීප අදහස ඇති වරණය තෝරන්න.

1) ගං වතුර තර්ජනයට මුහුණ දුන් ප්‍රදේශවාසීන් විශාල පිරිසකට **උන්හිටිතැන්** අහිමි විය
   1. දේපළ 2. වාසස්ථාන 3. නවාතැන් 4. වස්තුව

2) ඔහු කවොක්ති **අතැඹුලක් සේ දැන ගත්තේ** යැයි බොහෝ දෙනා ප්‍රකාශ කළහ
   1. නිර්මාණ කළේ යැයි 2. තක්සේරුවේ යෙදුණේ යැයි 3. මුළුමනින්ම දැනගත්තේ 4. අධ්‍යාපනයේ නිරත වී යැයි

3) සහෝදර සහෝදරියන් සමඟ **අත්වැල් බැඳගෙන** ජීවත් වූ කාලය කෙමෙන් ගෙවී ගියේය
   1. අතට අත දීගෙන 2. එකට එක් වී 3. වැලක් ලෙස එකතු වී 4. අත වැලක් මෙන් බැඳගෙන

- පහත සඳහන් වාක්‍යයන්හි හිස්තැන් වලට වඩාත් **සුදුසු** පදය තෝරන්න

4) විශේෂාංග ලිපියක්එහි අන්තර්ගත කරුණු සම්බන්ධ සැම............................ ම ආවරණය කරමින් සම්පාදනය කරන ලද්දක් විය යුතුය.
   1. මූලාශ්‍රයක් 2. සිද්ධියක් 3. පාර්ශවයක් 4. අවස්ථාවක්

5) ගොවිතැන සමඟ ................................ ම බැඳුණු අනෙක් මහාර්ඝ නිර්මාණය නම් වැවයි
   1. අතිවාර්යයෙන් 2. අත්‍යන්තයෙන් 3. අනන්‍යතාවයෙන් 4. අතිපූජනීයව

6) ............................ යන්නෙන් අදහස් කරන්නේ ජීවන තක්සලාවෙන් ලබන පරිණත බුද්ධියත්, ග්‍රන්ථ පරිශීලනයෙන් ලබන බහුශ්‍රැතභාවය නැතහොත් බහු පඨිතතාවත් ය.
   1.සතතාභ්‍යාසය 2. පරිකල්පනය 3. ව්‍යුත්පත්තිය 4. ප්‍රතිභාව

7) මේ දිවයිනේ ස්වාධීන ............................ මුල් බිජුවට සිටුවන ලද්දේ
   1. සභ්‍යත්වයක 2. සංස්කෘතියක 3.ශිෂ්ටාචාරයක 4. සම්ප්‍රදායක

8) අතීත උරුමයත් සංස්කෘතියත් හඳුනා ගැනීමට පුරාවස්තු............................ කිරීම හැමගේම වගකීමකි.
   1. සංරක්ෂණය 2.සංවර්ධනය 3. ප්‍රතිසංස්කරණය 4. පරීක්ෂණය

9) "අර්ධ ස්වර" හෙවත් අන්තඃස්ථාක්ෂර අනුරූප ස්වර යෙදී ඇති නිවැරදි පිළිතුර තෝරන්න
   1. අ,ආ,උ,ඌ 2. ඉ,ඍ,ඏ,උ 3.උ,ආ,ඍ,ඉ 4. උ,ඍ,ඏ,ඉ

10) අකාරාදී පිළිවෙලට නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න
   1. කන්කසන්තුරය,තිසාවැව,පිට බද්දර,බලපිටිය
   2.ගිරවා,සැළලිහිණියා,හංසයා,පරවියා
   3.අත්තනගල්ල,කුරුණෑගල,වීරවිල,මහරගම
   4.ඇන්තූරියම්,ඉද්ද,රෝස,පිච්ච

- අංක 11 සිට 13 තෙක් හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න

11) ජනාධිපත්වරණය කල්දැමීමට විවිධ ................................ බලපෑහ
   1. හේතූන් 2. හේතුහු 3. හේතු 4. හේතුවක්

12) ගුත්තිල කාව්‍ය කර්තෘ ...................... වැත්තැවේ හිමි කෝට්ටේ යුගයේ විසීය
   1.නොහොත් 2.හෝ 3.හෙවත් 4. හා

Learning Resource Center R De Mazenod College Kandana

13) .................. විසින් නාලාගිරි ඇතු දමනය කරන ලද අවස්ථාව චිවිධ ................ චිස්තර කරන ලදහ

1.බුදුරදු,කතුවරු　　2.බුදුරදුන්,කතුවරුන්
3. බුදුරදු, කතුවරුන්　　4.බුදුරදුන්,කතුවරු

14) කෙටි ඇදපිල්ල,පාපිල්ල,ඇලපිල්ල,රකාරාංශය යන පිලි පිළිවෙළින් නිවැරදිව යෙදී ඇති වචන පෙළිය තෝරන්න.

1. කුමාරිය,කුලකය, කාමරය, ද්‍රව්‍ය　　3.රුවනාර,පුවත්පත, කාමරය, ක්‍රමය
2.රැල්ල, රුවල, මාර්ගය, පත්‍ර　　4.කැමරාව,සාරණ, සිරස, ධර්මය

- අංක 15 සහ 16 ප්‍රශ්න වල සෑම පදයම අක්ෂර වින්‍යාසය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න

15) 1. වත් පිළිවෙත්,කැළඹීම,පරිශීලනය,ප්‍රකාශණය
2.පෙළපාලි, ප්‍රශංසාව,ශ්‍රේෂ්ඨ, සැළකිල්ල
3.ආභාසය, නිෂ්පත්තිය, ප්‍රෞඪ, යථාර්ථවාදී
4.අභිනිෂ්ක්‍රමණය, අනභිබවනීය,ප්‍රතිචලය, සාක්ෂාත්

16) 1. නිර්මාණය, ඓතිහාසික, කනගාටුව, උච්චාරණය
2.කෞතුක,තාක්ෂණය,ගවේශනය, නිෂ්පල
3. සාකච්ඡාව, ආභාෂය, පුස්ථකාලය, ඡන්දය
4.ලාංඡනය, නිර්භය, ලේඛනය, විශිෂ්ඨ

17) "නටනු ලැබූහ" යන අතීතකාල කර්මකාරක බහු වචන අඛ්‍යාතයෙහි, වර්තමාන කාල කර්තෘ කාරක බහුවචන ආඛ්‍යාතය වන්නේ,

1. නටයි　　2.. නැටුහ　　3. නටනු ලබති　　4. නටති

18) ඉරිඇඳි පදවල ක්‍රියා වර්ගය පිළිවෙලින් නිවැරදිව යෙදී ඇති පද පෙළිය තෝරන්න

- කනින දෙනින කාලෙම පින් කෙරුව <u>ශුභ</u>
- මිතුරු කමින් පෙරට <u>එකොත්</u>
- බෙරදවුල් හඬ <u>අසා</u> ඇහෙහි මස වියරු වෙයි
- කළු වලා <u>කැලඹේමින්</u>මුදුන් වී නැගෙනවා

1. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා
2. විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
3. විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
4.අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා,මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා

19) මූලින් දී ඇති වර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න

1. නිපාත පද - වහා,හෙට,මෙන්,අනේ
2. තද්ධිත පද - රිදීමය,සිල්වත්,දක්ෂතා,ජනතා
3.ක්‍රියා පද - නටවයි,දුවමින්,ලියා,බලන
4.යුගල පද - ඇතිනැති, එහාමෙහා, කරදර, උඩයට

20) තද කළු අකුරින් මුද්‍රිත පදයට සමානාර්ථවත් පදය තෝරන්න

"එකල්හි අනඳ මහතෙරහු බුදුන් කෙරේ බලවත් සෙනෙහයෙන් <u>අධිවාසනා</u> නොකටැහී"

1. අධික වාසනාව　　2. සෙත්පැතීම　　3. ඉවසීමේ ගුණය　　4. සෘද්ධි බලය

21) පහත ප්‍රකාශයට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න

"අයමාර්ග මුළුමනින්ම විනාශ කර දැමීම"

1. අටුව කඩා පුටුව සෑදුවා වගේ
2. අතු කඩා මොර කන්නා සේ
3. පූංචි අම්මාත් ඇවිත් කැවුම් පූංචි කළා වගේ
4. කැලේට පායපු හඳ වගේ

22) අර්ථයෙන් විරුද්ධ පද දෙකක් එකතු වී සෑදෙන යුගල පද ඇතුලත් නොවන පෙළිය තෝරන්න

1.ඉඩම් කඩම්, අග හිඟ, ඉඳුම් හිටුම්, ලේසි පහසු
2. උස් මිටි, ඇත්ත නැත්ත, යාම් ඊම්, ඔබ මොබ
3.ලාභ අලාභ, ගොඩ මඩ, හොඳ නරක, ඇත මැත
4. අය වැය, සිරිත් විරිත්, උඩබිම, පින්පව්

ද මැසිනොද් විදුහල - කඳාන

දෙවන වාර පරීක්ෂණය - 2019

26.07.2019

# සිංහල භාෂාව හා සාහිත්‍යය - III

| 10 ශ්‍රේණිය | කාලය : පැය 2 යි |
|---|---|

01. (i) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස් වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනු කොටසකට පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් ගසන්න.

(i). " ජඩය මැත නොදොඩා තොයිත් තාගේ පණ නොනසා යන අතක නැඟී යා."

(අ). මෙසේ බැන වදින්නේ කාට ද?

(ආ). ඉහත සිදුවීම අයත් පාඩම උපුටා ගත් ග්‍රන්ථයේ මූලාශ්‍ර කෘතිය කුමක් ද ?

(ii). "පන්සිළු වීණා නද පසු ........ බැස් වූ

මන් පිනවන වෙණ නාදයෙන් ........ තොස් වූ"

(අ). ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න.

(ආ). ගුත්තිල කාව්‍යයේ පද්‍ය සංඛ්‍යාව කොපමණ ද ?

(iii). " කැලෑ ජීවිතයෙහි ලකුණු ඇගේ ශරීරයෙහි ඇඳී තිබුණේය"?

(අ). මෙහි ඈ යනු කවුරුන් ද ?

(ආ). මෙම ප්‍රකාශය උපුටා ගත් ග්‍රන්ථයේ ඉංග්‍රීසි නවකතාවේ රචකයා නම් කරන්න.

(iv). " ජාතිය රන් විමනක් ........ වේ

ආගම මිණි පහනක් ........ වේ"

(අ). කවියේ ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න.

(ආ). මෙම කවියේ අර්ථ රසය නැංවීමට කවියා යෙදූ උපක්‍රමය කුමක් ද? එය උපුටා දක්වන්න.

(v). " නොයෙක් රසයෙන් අග්‍ර වූ , අමරා දේවීන් විසින් පිසින ලද භෝජනය අනුභව කොට ..."

(අ). මෙම සිද්ධියට අදාළ තැනැත්තා භෝජන අනුභව කොට හුදානම් වූයේ කුමන කාරණයක් සඳහා පිටත් වීමට ද?

(ආ). මෙහි අමරා දේවිය යනු කවුද ?

(vi). "ගොසින් ගොසින් කටු අත්තේ අග ........ සේමා

ඉතින් ළඳේ කරිවිල තිබ්බටු ........ සේමා"

(අ). කවියේ මුල් දෙපදය සම්පූර්ණ කරන්න.

(ආ). කරිවිල තිබ්බටු වලට සමාන කර ඇත්තේ කුමක් ද ?

(vii). " ඊසාන දිග සුළඟ හා වැස්ස ද අවුරුදු දෙකක් තිස්සේ උත්සහ කොටත් ගෙයි මැටි බිත්තිවල සවිය මැඩලන්නට සමත් නොවිය"

(අ). මෙහි සඳහන් ගෙය කාගේද?

(ආ). මෙහි සඳහන් භාෂා උපක්‍රමය කුමක් ද?

Learning Resource Center R De Mazenod College Kandana

(viii). " රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද"

(අ). ඉහත කවියෙහි ජීවිතයේ අනිත්‍ය බව පෙන්වීම සඳහා යොදා ඇති කවි පදය ලියන්න.

(ආ). ජනකවි වල ඉතිහාසය කවර යුගයක් දක්වා අතීතයට විහිදේ ද ?

(ix). පහත සඳහන් ජාතක කතා ඇසුරින් සම්පාදිත ගී කාව්‍ය නම් කරන්න.

(අ). කුස ජාතකය (ආ). සස ජාතකය

(x). (අ). එස්. මහින්ද හිමියන් විසින් ලියන ලද කවි අයත් වන ප්‍රධාන තේමාවක් ලියන්න.

(ආ). සිංහලට පරිවර්තිත ' මැකී ගිය දඩ මං' කෘතියේ කතුවරයා කවුද?

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i).
නහින් දෙහින කාලෙට පින් කෙරුම යුත
වහින කලට කුරින් විල් වලින් එත
බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත
පනින රිලවුං ට ඉනිමං කමක් නැත

(අ). මෙම පද්‍ය තුළින් ශබ්ද රසය ඇති කිරීමට කවියා යෙදූ උපක්‍රම දෙකක් ලියන්න.

(ආ). මෙම කවියෙන් ප්‍රස්තා පිරුළක් උපුටා දක්වන්න.

(ii). " කනක රජතාදීන් විචිත්‍ර වූ රක්ත නීලාදි වූ නා නා වස්ත්‍රයෙන් සමුජ්වලිත රථාදියෙහි නහන ලද නා නා ප්‍රකාර ධවලච්ඡත්‍ර පංක්තියෙන් ගැවසී ගත්තීය."

(අ). අංකිත පදවල අර්ථ ලියන්න.

(ආ). මෙයින් විස්තර කෙරෙන්නේ කුමක් පිළිබඳවද?

(iii).
" පියසන් නොව බිඟු දැල් රැඳි කොපුලී
අවසන් නොව වෙණ නදටම කුහුලී
මදයන් සුන් පියොවින් සිටි නොසැලී
ගජසෙන් සිතියම් ගජසිරි කියෙලී"

(අ). අංකිත පදවල අර්ථ ලියන්න.

(ආ). මෙහි දැක්වෙන සත්ව කොටස් දෙක නම් කර ඔවුන් පත්ව ඇති තත්ත්වය කෙබඳු දැයි කෙටියෙන් ලියන්න.

(iv). " එළදෙන ඇස් නොරවා හිස දික්කර ගෙන නිශ්චලව සිට තදින් කහින්නට පටන් ගති. දෑල හකුලවා ගෙන ඈ කැස්සේ ඉතා වේදනාවෙනි. කැස්ස නතර වුණු පසු එළදෙන යමකු සොයමින් මහපොළව තොලු ගාන්ට වන."

(අ). අංකිත පදවල අර්ථ ලියන්න.

(ආ). මෙහි සංකේතාර්ථවත් යෙදුම හා එයින් සංකේතවත් වන්නේ කාවද? යන්න ලියන්න.

(v). ජාතික <u>රණ දෙරණ</u> මතේ

ගැටී වැටී මල මොහොතේ

සුන්දර <u>සුරඹුන්ගේ</u> අතේ

නැළවෙන බව සිතනු පුතේ

(අ). අංකිත පදවල අර්ථ ලියන්න.

(ආ). කවියෙන් කියැවෙන ප්‍රධාන අදහස එක වැකියකින් කෙටියෙන් ලියන්න.

03. (03) සහ (04) ප්‍රශ්න සඳහා එක් පිළිතුරක නිදසුන් හැර වචන 125 -150 අතර තිබීම ප්‍රමාණවත්ය.

(අ). උපයුක්ත භාෂා රීතිය සහ

(ආ). යෝග්‍ය උපමා භාවිතය

උම්මග්ග ජාතකයේ සාර්ථකත්වයට හේතු වී ඇත.නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

එස්. මහින්ද හිමියෝ ළමා කාව්‍ය රචනයේදී,

(අ). දේශාභිමානය හා දේශානුරාගය වර්ධනය කිරීමත්,

(ආ). ගුණ දහමින් පෝෂණය කිරීමත් අරමුණු කරගෙන ඇති බව නිර්දිෂ්ට කවි පංතියෙන් නිදසුන් දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

04. බැද්දේගම නවකතාව සාර්ථක නවකතාවක් බවට පත්වී ඇත්තේ,

(අ). එහි සාර්ථක චරිත නිරූපණයත්,

(ආ). අවස්ථා සිද්ධි නිරූපණයත් නිසාය.

බැද්දේගම නවකතාවේ ඔබට නියමිත කොටසින් නිදසුන් දෙක බැගින් දෙමින් මේ ප්‍රකාශය විස්තර කරන්න.

නැතහොත්

ජනකවියා,

(අ). යහපත් ජීවිතයක් ගත කිරීමට උපදෙස් ද

(ආ). කවි රසවත් කිරීමට විවිධ කාව්‍යාලංකාර ද යොදා ගෙන ඇති ආකාරය ' හානා හීය පානා අඩහැරෙන් දැනේ...' පාඩමෙන් නිදසුන් දෙක බැගින් දෙමින් සාකච්ඡා කරන්න.

5 , 6 , 7, ප්‍රශ්නවලින් එකක් තෝරාගෙන පිළිතුරු ලියන්න. නිදසුන් හැර පිළිතුරේ වචන `100 - 125 අතර වීම ප්‍රමාණවත්ය.

5. ගුත්තිල පඬිතුමාගේ වීණා නාදයේ මිහිරෙන් දෙව් මිනිස් සත්ත්ව යනාදී සියල්ලෝ මත්වූ අයුරු පාඩමේ නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක් ගෙන පැහැදිලි කරන්න.

6. පුද්ගල චරිත හා දේශීය ගැමි පරිසරය විදේශිකයෙකුගේ සියුම් නිරීක්ෂණයට හසුවී ඇති අයුරු බැද්දේගම නවකතාවේ නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක් ගෙන පැහැදිලි කරන්න.

7. පරිසර අත්දැකීම් උපයෝගී කොටගෙන උපදෙස් ලබා දීමට ජනකවියා සමත් වී ඇති අයුරු ' හානා හිය පානා ...' පද්‍ය පන්තියෙන් නිදසුන් තුනක් දක්වමින් විමසන්න.